www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 6 – First Term Test – April 2019

පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 6 ශ්‍රේණිය

කාලය : පැය 2
**Time :2hour**

## Buddhism– I

## බුද්ධ ධර්මය– I

Name :- ................................................... Grade : -................ Index number:-....................

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා එම පිළිතුර යටින් ඉරක් අඳින්න.**
- **එක ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ලකුණු 40ක් හිමි වේ.**

1. "බුදුවන්නට කාලය පැමිණ ඇතැයි බෝසතාණන්ට ආරාධනා කළේ,

   (1) කොණ්ඩඤ්ඤ බමුණා ය (2) සර්වමිත්‍ර බමුණා ය

   (3) සහම්පති මහා බ්‍රහ්මයා ය (4) අසිත තවුසා ය

2. දෙව්දහ නුවර අපට වැදගත් වන්නේ,

   (1) කෝසල රජුගේ රාජ්‍යය පිහිටි නුවර නිසා ය

   (2) මහාමායා දේවියගේ දෙමාපියන් සිටි නුවර නිසයි

   (3) සුද්ධෝදන රජුගේ රාජ්‍යය පිහිටි නුවර නිසයි

   (1) බිම්බිසාර රජුගේ රාජ්‍ය පිහිටි නුවර නිසයි

3. සුද්ධෝදන රජතුමා සිදුහත් කුමරුට දෙවන වරට වදිනු ලැබුවේ,

   (1) අසිත තවුසාට පෙන්වූ වේලාවේදී ය

   (2) කුමරුට නම් තැබූ දිනයේ ය

   (3) වප් මගුල් දිනයේ ය

   (4) කුමරු ඉපදුනු දිනයේ ය

4. සිදුහත් කුමරු ගිහිගෙය හැර ගියේ,

   (1) වෙසක් පෝය දා ය (2) පොසොන් පෝය දාය

   (3) දුරුතු පෝය දා ය (4) ඇසළ පෝය දා ය

5. අනෝමා ගංතෙර එතෙර වූ බෝසත් කුමරුට පැවිදි වීමට අවශ්‍ය සිවුරු පිරිකර පිළිගන්වන ලද්දේ,

   (1) ද්‍රෝණ බමුණා ය (2) ඝටීකාර බමුණා ය

   (3) භාරද්වාජ බමුණා ය (4) සහම්පති බමුණා ය



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

6. බෝමුල කරා ගිය බෝධිසත්වයින් වහන්සේ කුස තණ අට මිට එහි අතුරා පැන නැගී වජ්‍රාසනයෙහි වැඩ හිඳ, බුද්ධත්වය ලබා මිස නොනැගිටිමි'' යි කළ මෙම ප්‍රකාශයෙන් අදහස් වන්නේ, උන්වහන්සේ තුළ පැවති,
   (1) දැඩි ඉවසීමයි (2) දැඩි කැපවීමයි
   (3) දැඩි අධිශ්ඨානයයි (4) දැඩි ලෝභකමයි

7. සිදුහත් බෝසතාණෝ උපදවා ගත් ''පෙර අත්බව සිහි කරන නුවණ හැඳින්වූයේ,
   (1) පුබ්බේ නිවාසානුස්සති ඥානය නමිනි
   (2) ආසවක්ඛය ඥානය නමිනි
   (3) චුතූපපාත ඥානය නමිනි
   (4) ආකිඤ්චඤ්ඤායතනය නමිනි

8. ''සද්ධාය සම්පදිත්තේන'' යනුවෙන් අප සජ්ඣායනය කරන්නේ,
   (1) මල් පූජා කරන ගාථාවයි (2) බෝධිය වන්දනා කරන ගාථාවයි
   (3) පහන් පූජා කරන ගාථාවයි (4) පැන් පූජා කරන ගාථාවයි

9. විහාරස්ථානයේ පිහිටි උද්දේසික චෛත්‍ය වන්නේ,
   (1) බෝධින් වහන්සේ ය (2) වෙහෙර වහන්සේ ය
   (3) ධාතූන් වහන්සේ ය (4) පිළිම වහන්සේ ය

10. ගිහි පුද්ගලයින් විසින් භාවිතා කරන, පහත සඳහන් වචන හතර සඳහා භාවිතා කරන ශාසනික වචන අනුපිළිවෙළට දක්වා ඇති නිවැරදි පිළිතුර තෝරන්න.
    (නානවා, කනවා, යනවා, නිදනවා)

    (1) පැන් පහසු වෙනවා, වළඳනවා, වඩිනවා, සැතපෙනවා
    (2) වළඳනවා, සැතපෙනවා, පැන් පහසු වෙනවා. වඩිනවා
    (3) වඩිනවා, වළඳනවා, සැතපෙනවා, පැන් පහසු වෙනවා
    (4) සැතපෙනවා, වඩිනවා, සැතපෙනවා, පැන් පහසු වෙනවා

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

- **11-15 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ හරිනම් (√) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද වරහන තුල යොදන්න.**

11. සුදු ඇත්පැටවෙක් සුදු පියුමක් හොඬින් ගෙන තම කුසට ඇතුළු වනු සිහිනෙන් දුටුවේ මහාමායා දේවියයි. ( )
12. සිදුහත් කුමරු ස්ථිරවම (ඒකාන්තයෙන්ම) බුදුබවට පත්වන බව ප්‍රකාශ කළේ අසිත තවුසා යි. ( )
13. මෛත්‍රී භාවනාව වැඩීමේදී අප පළමුව මිතුරු බව පතුරවන්නේ තමාටයි. ( )
14. නිබ්බුත පද කීවේ යසෝදරා දේවියයි. ( )
15. ''බුදු බව ලබා පළමුව මගේ රාජ්‍යයට වඩින්නැ'' යි ඉල්ලා සිටියේ බිම්බිසාර රජතුමා ය. ( )

- **16-20 දක්වා හිස්තැනට සුදුසු වචනය වරහන් තුලින් තෝරා ලියන්න.**

(සිදුහත්, ඡන්න, ඇසල,කන්ථක, මහාභිනිෂ්ක්‍රමණය)

එදින ....................................16 පුන් පොහොය දිනයකි. රජ සැප හැර දැමූ සිදුහත් කුමරා.................................. 17 ඇමති සමඟ.................................. 18 අසු පිට නැඟී මාලිගයෙන් නික්ම ගියේය. මෙසේ ගිහි ගෙය හැර යාම...................................19 ලෙස හැඳින්වේ. නොයෙකුත් බාධක මැද.................................. 20 කුමරුන් ගිය මේ ගමන ලෝක සත්ත්වයා දුකින් මුදාලීමට උපකාරී වූ ගමනකි.

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 6 – First Term Test – April 2019

පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 6 ශ්‍රේණිය

## Buddhism – II

බුද්ධ ධර්මය– II

Name :- .................................................... Grade : -................ Index number:-....................

**II කොටස**

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**
- **තවත් ප්‍රශ්න හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20කි. අනෙක් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් හිමි වේ.**

1. එදිනෙදා ජීවිතයේදී නොයෙක් අභියෝග වලට මුහුණ දීමට ඔබට සිදුවිය හැකියි. සිදුහත් කුමරු ද එම අභියෝග වලට නොසැලී මුහුණ දුන්නේ ය. සිදුහත් කුමරුගේ චරිතයේ එම අභියෝග අදාල කරගෙන, ඔබ පන්ති කාමරයේ දී සිදුකළ ඇගයීමට අනුව පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   (i) සිදුහත් බෝසතාණන් ආසන්න පෙර භවයේ සිටියේ කිනම් දෙව්ලොවෙහි ද?

   (ii) පංච මහා විලෝකන හඳුන්වන තවත් නමක් ලියා, පංච මහා විලෝකන 2ක් ලියන්න.

   (iii) බෝසත් කුමරු ඉපදුනේ කවදා ද? කොහෝ දී ද?

   (iv) සිදුහත් කුමරු උගත් ශිල්ප ශාස්ත්‍ර දෙකක් ලියන්න.

   (v) සිදුහත් කුමරු සමග ශිල්ප ශාස්ත්‍ර උගත් කුමාරුවරු දෙදෙනෙක් නම් කරන්න.

   (vi) සිදුහත් කුමරු මුහුණ දුන් අභියෝග දෙකක් නම් කරන්න.

   (vii) පස්වග තවුසන් අතරින් දෙදෙනකු නම් කරන්න.

   (viii) බුදුවීමේදී සිදුහත් බෝසතාණන් මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කරන්න.

   (ix) ශිෂ්‍යයකු වශයෙන් පාසලේ දී ඔබ මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න.

   (x) එම අභියෝග ජය ගැනීම සඳහා ඔබ තුළ තිබිය යුතු ගුණාංග දෙකක් ලියන්න.

2. (i) සිදුහත් බෝසත් උපත සමග සිදුවූ අසිරිමත් සිදුවීම් දෙකක් ලියන්න. (ල.02)

   (ii) අග්ගෝ හමස්මි ලෝකස්ස.....යන ගාථාව සම්පූර්ණ කරන්න. (ල.03)

   (iii) බෝසත් කුමරුගේ චරිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 4ක් ලියන්න. (ල.03)

3. (i) සිදුහත් බෝසතාණෝ දුෂ්කර ක්‍රියා කළ කාලය කොපමණ ද? (ල.02)

   (ii) පැවිද්දකු විසින් අත්හළ යුතු අන්ත දෙක කුමක් ද? (ල.03)

   (iii) සුඛෝ බුද්ධානං උප්පාදෝ... යන ගාථාව සහ එහි තේරුම ලියන්න. (ල.05)



Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

4. (i) තෙරුවන් නම් කරන්න. (ල.02)

(ii) විහාරස්ථානයේ දී ඔබ විසින් අනුගමනය කරන වතාවත් 3ක් ලියන්න. (ල.03)

(iii) බෝධීන් වහන්සේ වන්දනා කරන ගාථාවක් ලියන්න. (ල.05)

5. (i) ''මෛත්‍රිය '' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ල.02)

(ii) භාවනාවට පෙර ඔබ කළ යුතු කාර්යයන් 3ක් ලියන්න. (ල.03)

(iii) මෛත්‍රී භාවනාව වැඩීමෙන් ඔබට ලැබෙන ආනිශංස 5ක් ලියන්න. (ල.05)

6.

(i) ''මහා ශ්‍රමණයන් වහන්ස, ඔබ වහන්සේගේ සෙවනැල්ලෙන් මට සැපය පිය කෙනෙකුගෙන් උරුම විය යුතු දේ ලබා දෙනු මැනවි'' මෙම ප්‍රකාශය කළේ කවුද? කාහට ද? (ල.02)

(ii) රාහුල හාමුදුරුවන්ගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ 3ක් ලියන්න. (ල.03)

(iii) එම ආදර්ශ ඔබේ ජීවිතය යහපත් කර ගැනීමට ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න. (ල.05)

7. (i) දියුණුවේ රන් දොරටු සයක් ඇතුළත් ඔබ ඉගෙනගත් ''දියුණුවේ රන් දොරටු'' පාඩමට අදාල ජාතක කතාව කුමක් ද? (ල.02)

(ii) එහි සඳහන් වන පරිදි දියුණුවට හේතුවන කරුණු 3ක් සඳහන් කරන්න. (ල.03)

(iii) ඔබගේ ජීවිතය දියුණුවට පත් කර ගැනීමට එම කරුණු තුන හේතු වන ආකාරය පැහැදිලි කරන්න. (ල.05)

agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!